# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2477/34 - 2026 පෙබරවාරි මස 25 වැනි බදාදා - 2026.02.25**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රේගු ආඥා පනත යටතේ නිවේදනය**

(ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 05/2025)

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 10 වැනි වගන්තිය යටතේ වූ පහත සඳහන් යෝජනාව 2026 පෙබරවාරි මස 18 වැනි දින පවත්වන ලද ප්‍රසිද්ධ සභාවාරයේ දී පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ආචාර්ය **හර්ෂණ සූරියප්පෙරුම,**
ලේකම්,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය.

2026 පෙබරවාරි මස 24 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**යෝජනාව**

මෙම යෝජනාව *ගැසට් පත්‍රයෙහි* නිවේදනය කරනු ලබන දිනයෙහි සිට (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ “අ” උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, මෙම පාර්ලිමේන්තුව තීරණය කරයි.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

| සං. ව. ශීර්ෂය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය (2) | | විස්තරය (3) | තීරු බදු ප්‍රමාණය වරණීය (4) | තීරු බදු ප්‍රමාණය සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **08.05** | | | **අලුත් හෝ වියළි පැඟිරි වර්ගයේ පළතුරු** | | | |
| | | | | | | |
| | | - | ජමනාරන් (සම්සුමාස්) ජපන් දොඩම් හා නස්නාරං (ටැන්ගරින්) ඇතුළුව, ක්ලෙමන්ටයින්, විල්කින්ස් සහ එවැනි පැඟිරි වර්ගයේ බද්ධ කළ ඒවා: | | | |
| | | | | | | |
| | 0805.29 | -- | වෙනත්: | | | |
| | 0805.29.10 | --- | අලුත් | (PK) නිදහස්<br>(SA) 17% හෝ කිලෝ ග්‍රෑමයකට රු. 51<br>(SF) 5%<br>(SD) 5%<br>(SG) 20% | 20% හෝ කිලෝ ග්‍රෑමයකට රු. 60 | කි.ග්‍රෑ. |

EOG 02 - 0216

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.